**තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන වැඩසටහන - 2020**
-----------------------------------------------------------

තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන වැඩසටහනේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල අතර 2017 ඔක්තෝම්බර් 20 දින එළඹි උපදේශකයේ 10 වන වගන්තියේ සඳහන් විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

ණය ගිවිසුමට අනුව, අධ්‍යාපන අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මෙම වැඩසටහනේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ පවතින ද්විතීයික අධ්‍යාපන ක්‍රමයේ ධාරිතාව ශක්තිමත් කිරීමයි. සිවිල් වැඩ, උපකරණ, ගෘහභාණ්ඩ, ධාරිතා සංවර්ධනය ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් වේ. ණය ගිවිසුමට අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 9287.1 ට සමාන එ.ජ.ඩො. මිලියන 60.70 ක් වූ අතර ඉන් රු. මිලියන 7,650 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 50 ක් ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල විසින් මූල්‍යකරණය කිරීමට එකඟ විය. ඉතිරි මුදල වූ රු. මිලියන 1637.1 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යකරණය කිරීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය 2019 වර්ෂයේ දී එහි ක්‍රියාකාරකම් ආරම්භ කරන ලද අතර 2022 සැප්තැම්බර් 30 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය 2024 මාර්තු 30 දක්වා දීර්ඝ කර ඇත.

**1.3 මතය**

2020 දෙසැම්බර් 31 දිනට මෙම වැඩසටහනේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු / විගණන නිරීක්ෂණය | මුදල රු. මිලියන | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2020 වර්ෂයේ සිට ගෙවිය යුතු වගකීම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෝ හෙළිදරවු කර නොතිබුණි. | 43 | ඉදිරි වසර සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී මෙම වගකීම් මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම හෙළිදරවු කිරීමට කටයුතු කරන ලෙස සටහන් කර තිබුණි. තවද, 2023 වර්ෂයේ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීම සඳහා ට වගකීම් ලේඛන ඉදිරිපත් කර ඇත. | සියලුම වගකීම් මූල්‍ය ප්‍රකාශනයේ හෙළිදරව් කළ යුතුය. |

**2.2 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම**

| අංකය | නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම / විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| අ | 2019 මාර්තු 15 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 හි 9.3 ඡේදය සහ උපදේශකයේ 12 ඡේදය අනුව | ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම අවම වශයෙන් මාස 02 කට වරක්වත් පැවැත්විය යුතුය. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය තුළ එක් කමිටු රැස්වීමක් පමණක් පවත්වන ලදී. | 2020 වර්ෂයේ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් රට වසා දැමීම මත මෙහෙයුම් කමිටු රැස්වීම් එක් රැස්වීමකට පමණක් සීමා කර තිබුණි. ඉදිරි වසරේදී අදාළ චක්‍රලේඛයට අනුව කටයුතු කරන ලෙස කාර්ය මණ්ඩලයට උපදෙස් ලබා දෙන ලදී. | චක්‍රලේඛ උපදෙස් සහ ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතේ දක්වා ඇති උපදෙස් පිළිපැදීමට කටයුතු කළ යුතුය. |
| ආ | උපදේශකයේ අධීක්ෂණ සැලැස්මේ 10 ඡේදය අනුව | වැඩසටහන වෙනුවෙන් දරන ලද වියදම් ඇතුළත් කර පිළියෙළ කරන ලද මූල්‍ය ප්‍රකාශනය වාර්ෂිකව විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, කෙසේ වෙතත් 2020 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2023 දෙසැම්බර් 07 වැනි දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. | 2020 වර්ෂයේදී බාහිර වශයෙන් බඳවා ගන්නා ලද කාර්ය මණ්ඩලයක් යටතේ පැවති ඒකකයක් හරහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. 2021 වර්ෂයේදී එම ඒකකය අවසන් කර අමාත්‍යාංශයේ නිලධාරීන් යටතේ ක්‍රියාත්මක වන කාර්ය මණ්ඩලයකට එම ව්‍යාපෘතිය භාර දෙන ලදී. එබැවින්, 2019 සහ 2020 වර්ෂ සඳහා වූ අවසන් ගිණුම් වාර්තා සැකසීම නව කාර්ය මණ්ඩලය යටතේ සිදු කරන ලදී. නව කාර්ය මණ්ඩලයේ නිලධාරීන් තම ප්‍රධාන රාජකාරියට අමතරව ව්‍යාපෘතියේ කටයුතු සිදු කරන අතර අවසන් ගිණුම් වාර්තා සැකසීමට අදාළ තොරතුරු 2019 සහ 2020 වර්ෂවලදී එක්රැස් කර විශ්ලේෂණය කිරීමට සිදුවීම හේතුවෙන් මෙම ප්‍රමාදය ඇති වී තිබුණි. | විගණනය සඳහා මූල්‍ය ප්‍රකාශනය වාර්ෂික පදනමින් ඉදිරිපත් කළ යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

| ක්‍රියාකාරකම | 2020 දෙසැම්බර් 31 දිනට | | ප්‍රමාදය/ විගණන නිරීක්ෂණය | ප්‍රමාද වීමට හේතු | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|
| | අපේක්ෂිත භෞතික කාර්ය සාධනය ඒකක/ ප්‍රතිශතය | සාක්ෂාත් කර ගන්නා ලද කාර්යසාධනය ඒකක/ ප්‍රතිශතය | | | | |
| සිවිල් වැඩ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ, ගෘහ භාණ්ඩ, ධාරිතා සංවර්ධනය, උපදේශන සේවය, ව්‍යාපෘති කළමනාකරණය | 06 | 01 | සිවිල් වැඩ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ, ගෘහ භාණ්ඩ, ධාරිතා සංවර්ධනය, උපදේශන සේවය, ව්‍යාපෘති කළමනාකරණය යන කාර්යයන් හයක් 2020 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණි. කෙසේ වුවද, 2020 වර්ෂයේදී පාසල් තේරීම් කටයුතු සැලසුම් කිරීම පමණක් සිදු කර ඇති අතර වැඩසටහනේ අනෙකුත් ප්‍රධාන ක්‍රියාකාරකම් 05 සම්බන්ධයෙන් ප්‍රගතියක් ලබා නොතිබුණි. | 2019 අප්‍රේල් මාසයේ සිදු වූ පාස්කු ප්‍රහාරය සහ 2020 ජනවාරි මාසයේ කොවිඩ් සඳහා රට අගුලු දැමීම හේතුවෙන් අනෙකුත් කටයුතු සැලසුම් කළ පරිදි සිදු කිරීමට නොහැකි වී ඇත. | 2019 අප්‍රේල් මාසයේ සිදු වූ පාස්කු ප්‍රහාරය සහ 2020 ජනවාරි මාසයේ කොවිඩ් සඳහා රට වසා දැමීම හේතුවෙන් අනෙකුත් කටයුතු සැලසුම් කළ පරිදි සිදු කිරීමට නොහැකි වී ඇත. | නියමිත කාල සීමාව තුළ ව්‍යාපෘති ක්‍රියාකාරකම් සිදු කළ යුතුය. |

**3.2 නිශ්කාර්ය සම්පත්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| 2020 වසර සඳහා වෙන් කළ රු. මිලියන 49 ක් වූ දේශීය අරමුදල සහ රු. මිලියන 204 ක් වූ විදේශ අරමුදල සම්පූර්ණයෙන් උපයෝජනය කර නොතිබුණි. | 2020 වර්ෂයේ දී රට වසා දැමීම සහ රාජකාරියට පැමිණීම සීමා කිරීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රගතිය ලබා ගැනීමට අපොහොසත් වීම හේතුවෙන් අදාළ දේශීය හා විදේශීය අරමුදල් ඉතිරි විය. | ණය අරමුදල් නියමිත කාලසීමාවන් තුළ ලබා දී භාවිතා කළ යුතුය. |

**3.3 පද්ධති සහ පාලන**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| අදාළ අධිකාරිය විසින් අදාළ නිලධාරියාගේ පැමිණීමේ සහ පිටවීමේ වේලාවන් තහවුරු කර නොගෙන සකස් කරන ලද වවුචර මත පදනම්ව එම නිලධාරියා සඳහා අතිකාල දීමනාව ගෙවා තිබුණි. | බාහිරව බඳවාගත් නිලධාරීන්ගෙන් සමන්විත ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට අදාළ පැමිණීමේ සහ පිටවීමේ වේලාවන් තහවුරු කර නොගෙන මුදල් ගෙවා ඇති බව නිරීක්ෂණය වේ. ගෙවීම සඳහා ඉදිරිපත් කරන ලද වවුචර සහතික කිරීමේදී අවශ්‍යතා සියල්ල සම්පූර්ණ වී ඇත්දැයි පරීක්ෂා කිරීමට උපදෙස් ලබා දෙන ලදී. | ගෙවීම් සඳහා ඉදිරිපත් කරන ලද වවුචර සියලු අවශ්‍යතා සපුරා ඇත්දැයි පරීක්ෂා කළ යුතුය. |